# අනුරාධපුර යුගයේ වාරි තාක්ෂණය හා ඒ හා බැඳුණු නීති රීති පිළිබඳ අධ්‍යයනයක්

ඩී.එම්.ජී.සී. දිසානායක

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

gihanchalindha@gmail.com

ප්‍රමුඛ පද:වාරි තාක්ෂණය, අනුරාධපුර යුගය, කෘෂිකර්මාන්තය, පැරණි වැව්

## හැඳින්වීම

අනුරාධපුර යුගයේ අවසානය දක්වා වූ කාලවකවානුවට අයත් ඇතැම් ශිලා ලේඛනවලින් වාරි මාර්ග ක්‍රමවල ස්වරූපය, නඩත්තුව, වාරි මාර්ග නීති රීති හා වාරිමාර්ග නිලධාරීන් මෙන්ම වාරි තාක්ෂණය පිළිබඳව ද කරුණු අනාවරණය වේ. රටේ වාරි මාර්ග පද්ධතියේ දියුණුවත් එහි ප්‍රතිඵලයත් ලෙස ඊට සමගාමීව සිදු වූ කෘෂිකාර්මික දියුණුව ද දැකගත හැකි ය. අභිලේඛනවලට අනුව වැව් හා ඇළ මාර්ග මෙන්ම අමුණු පිළිබඳව ද තොරතුරු සඳහන් වේ. එම ශිලා ලේඛනවල සඳහන් සාධකවලට අනුව වාරිමාර්ගවල ව්‍යාප්තිය පිළිබඳව හා එහි තාක්ෂණය පිළිබඳව දළ සටහනක් සකසා ගත හැකි ය. අතීතයේ අනුරාධපුර යුගයේ පැවැති හෙළවාරි තාක්ෂණය පිළිබඳ ව තොරතුරු කවරේදයන්න අනාවරණය කර ගැනීම මෙම අධ්‍යනයේ මූලික අරමුණ විය. අතීතයේ අනුරාධපුර රාජ්‍යය සමයේ වඩාත් ක්‍රමික හා දියුණු වැව් වාරි තාක්ෂණයක් පැවතියේය. එකල දිවි ගෙවූ කෘෂි කාර්මික ජනයාගේ දැනුම එම වාරිමාර්ග තාක්ෂණය උදෙසා කෙලෙස භාවිත කරන්නට යෙදුණේ ද? එම වැව් ක්‍රමවත් ව පාලනය කිරීම සඳහා පැවැති නීති කවරේ දැ යි මෙ මඟින් අධ්‍යයනය කෙරේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වන්නේ සාහිත්‍යය මූලාශ්‍රයෝ පරිශීලනය යි. දත්ත රැස් කිරීම සඳහා ද්විතීය හා තෘතීය මූලාශ්‍රය උපයෝගී කරගන්නා ලදි. මෙහිදී අනුරාධපුර යුගයේ පැවැති වැව් පිළිබඳව අධ්‍යයනය කරමින් ඒවායෙහි වාරි තාක්ෂණය අධ්‍යයනය කිරීම සිදුකර තිබේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අතීතයේ වැව හා මිනිසා අතර පවතින්නේ සමීප සබඳතාවයකි. එකල රජවරු පවා තම රාජ්‍යය කාලය අතරතුර වැඩි වශයෙන් වෙහෙස වී ඇත්තෙ රටෙහි වාරිමාර්ග පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ය. වර්තමානයේ විවිධ පළාත්වලින් එම වාරිමාර්ග පිළිබඳව තොරතුරු සඳහන් ශිලා ලේඛන හමුවෙයි. එම ශිලා ලේඛනවලට අනුව වාරිමාර්ගයන්හි අයිතිය කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය. එනම් රජය සතු වාරි මාර්ග, විහාරාම සතු වාරිමාර්ග හා පෞද්ගලික අයිතිය යටතේ වූ වාරිමාර්ග යනුවෙනි. ඇතැම් වාරිමාර්ගවල අයිතිය සම්බන්ධයෙන් නිගමනයකට පැමිණීමට උපකාර වන සාධක කිසිවක් සෙල්ලිපිවල අන්තර්ගත නොවන අවස්ථා ද හමුවේ. IV වැනි මිහිඳු රජ සමයේ වෙස්සගිරි ලිපියෙහි තිසා වැවේ ජලය භාවිත කිරීම සම්බන්ධයෙන් රජු විසින් පනවන ලද

නීති රීති දක්නට ලැබේ. මහා කස්සප රජුගේ සීගිරි ටැම් ලිපියෙහි ''දොලොස් මහ වෑ සුන වැරියන් නොගන්න ඉසා''යනුවෙන් දැක්වේ. වැරියන් යනු රටවැසියන් විසින් නොමිලේ සේවය ලබා දීමට බැඳී සිටි සේවයයි. දොළොස් මහ වැව් යනුවෙන් සඳහන් වන වැව් රජය සතු වැව් බවට සඳහන් වේ. ඒ බව ගොන්නෑව දේවාල ටැම් ලිපියෙහි දක්වා තිබේ. ක්‍රි. ව. 4-5 වැනි සියවස් අතරට අයත් පානම වැව විහාරගිරි ලිපියෙහි ''බයුතරී'' නම් වැවක් විහාරයට පූජා කළ බව ''බයුතරී වවියෙ සගහටය දි'' යන පාඨයෙන් හෙළි වෙයි. මෙයින් විහාරාම සතු වැව් පැවති බවට උපකල්පනය කළහැකි ය. ක්‍රි. ව. 4-6 වැනි කාලයට අයත් දන්තපාද විහාර ශිලා ලිපියෙහි ''ගනය පවහ වසන ජයසවලහ ච ද වව''යනුවෙන් ජයසවල නැමැත්තෙක් නම් වැව් හිමියෙකු සම්බන්ධව කියැවේ. පෞද්ගලික මැදිහත් වීමකින් කරන ලද තවත් වැවක් පිළිබඳව රිදී විහාර පර්වත ලිපියකින් තොරතුරු අනාවරණය වේ. වාරි තාක්ෂණය සම්බන්ධයෙන් අභිලේඛන වලින් හමුවන තොරතුරු සීමිත ය. IV වැනි මිහිඳු රජුගේ වෙස්සගිරි ශිලා ලිපියෙන් තිසා වැවේ ජලය බෙදා හැරීම සම්බන්ධයෙන් කරන ලද ආඥාවක් හා තාක්ෂණය සම්බන්ද වැදගත් තොරතුරු හෙළිවේ. එහි සඳහන් වන ''රද් සොරො'' යන්නෙන් ප්‍රධාන සොරොව්ව හදුන්වා දී ඇති බව පෙනී යයි. සොරොව්ව විවෘත කිරිමට හා වැසීමටත් එමඟින් වැවේ ජල ප්‍රමාණය පලනය කිරිමටත් සකස් කරන ලද යාන්ත්‍රණයක් විය. ඒ සඳහා යොදා ගත් ජල පාලන උපකරණය හඳුන්වා ඇත්තේ ''මොහොල'' යනුවෙනි. වැව් ජල මට්ටම දැන ගැනිමත් එමඟින් නිකුත් කරන ජල ප්‍රමාණය තීරණය කිරිමටත් වැව තුළ සවි කළමාපකය 'දිය කැට පහණ'' නම් විය. ජල මට්ටම රියන් හතරක් වන තුරු මොහොල මඟින් සොරොව්ව විවෘත කර කුඹුරුවලට ජලය ලබා දිය යුතු බව ශිලා ලිපියෙහි දක්වා ඇත.ශිලා ලිපියට අනුව තිසා වැවේ ජලය මුලින්ම ''දානවැ'' නමින් හැඳින් වූ වැවකට යවා එහි සිට විහාරයට අයත් කුඹුරුවලට බෙදා හැරීම සිදු කර තිබේ. ක්‍රි. ව. දෙවැනි සියවසට අයත් ජේතවනාරම ශිලා ලිපියෙහි ගම් වැව්, විශාල වැව් හා ගබඩා වැව් යනුවෙන් වැව් වර්ග 3 කට බෙදා ඇති බව සඳහන් වේ. මෙහි ගම් වැව් යනු කුඩා ප්‍රමාණයේ වැව් ලෙස හඳුනා ගත හැකි ය.

වාරිමාර්ගවල ආරක්ෂාව හා විධිමත් ජල කළමනාකරණය සිදූ කිරිම සහ පනවා තිබූ නීති පිලිබඳව ද ඇතැම් තොරතුරු අභිලේඛන මඟින් අනාවරණය වේ. වැව් ප්‍රතිසංස්කරණය කර කෘෂිකර්මාන්තයට ජලය ලබා දීම තුළින් කෘෂිකර්මාන්තය ස්වංපෝෂිත කිරීම රජුගේ වගකිමක් වන අතර වාරිමාර්ග නඩත්තු කර පවත්වාගෙන යාම ද රජුගේ වගකීමක් වී ඇත. වැව් නඩත්තුව සඳහා '' වැරි ''නමින් ශ්‍රමය භාවිතයට ගත් බව සෙල්ලිපිවල සඳහන් වේ. රට වැසියන් විසින් නිශ්චිත දින ගනණක් නොමිලේ වැඩ කල යුතු අතර එය ''වැරි'' යනුවෙන් හඳුන්වා ඇත. මෙම ශ්‍රමය වාරිමාර්ග නඩත්තුව සඳහා භාවිතා කර ඇත. දොරබාවිල ටැම් ලිපියෙහි සහ සීගිරි ටැම් ලිපියෙහි වැව් නඩත්තු කිරිම ඉතාම වැදගත් කොට සැලකූ අතර ඒ සඳහා රට වැසියන් ලබාදිය යුතු ශ්‍රමය අනිවාර්යය බව දක්වා ඇත. වැව් නඩත්තු කල ශ්‍රම බලකාය පෝෂණය කිරිම සඳහා''වැරිසාල්'' යනුවෙන් බද්දක් ද මී ගවයින් ද ලබා ගත් බවට තොරතුරු හමුවේ. යම් යම් වැරදිවලට දඬුවම් වශයෙන් වැව්වල වැඩ කිරිමට සිදූ වූ බවත් එලෙස නොකළහොත් දඩ ගෙවීමට සිදු වූ බවත් මිහින්තලා පුවරු ලිපියෙහි මෙසේ සඳහන් වෙයි.

''කුඩින් කළ වරජක් ඇත ගම් සිරිත් දඬ කිරා කිරූ දඬ මිනැ ඇකැ අවට සොළොස් රියන් ගැම්බුර රියන් ලබුළ්

බැගින් ගෙනැ වැව් මෙහි කැරවියැ යුතු නොකළකිරු දඩ ගතැ යුතු". අමුණු හෝ වේල්ල අතර ගවයන් නො බැඳ යුතුය. ගවයන් ඒ මත ගමන් කිරීමෙන් එය බාදනයවීම නතර කිරීම මෙහි අරමුණ වේ. එය අල්ලායි ටැම් ලිපියෙහි "අවුණට් මීවුන් නොගන්නා ඉසා" යනුවෙන් සඳහන් වේ. වෙස්සගිරි ශිලා ලිපියෙහි ජලය බෙදා හැරීම සම්බන්දයෙන් පනවන ලද නීති ඇතුළත් වේ. වෙස්සගිරි විහරයට අයත් කුඹුරුවලට නිකුත් කළ ජලය භික්ෂූන් කොළොම්බ ඇළට ජලය ගලා යාමට සැලැස්වීම නොකල යුතු බව සඳහන් වේ. ජලය ලබා නො දීම හා ජල සැපයුමට බාදා නො කිරීම කෙත් වතු වැනසීම නොකල යුතු බවට නීතියක් පැවති බව සඳහන් වේ. "පියොවදාරන්නන් හා පියොවදාරනුවන් " යන නම්වලින් හැඳින් වූ වාරි නිලධාරීන් සිටි බවට සෙල්ලිපි තුළින් අනාවරණය වේ. මිහින්තලා ශිලා ලිපියෙහි "වැ වැජැරුම" නම් නිලධාරියෙකු පිලිබඳව ද සඳහන් වේ. මොවුන්ගේ වගකීම වන්නට ඇත්තේ වාරිමාර්ග නිසියාකාරව පවත්වාගෙන යාමයි. මීට අමතරව විවිධ ශිලා ලිපි තුළ විවිධ නම්වලින් හැඳින් වූ වාරි නිලධාරීන් මෙන්ම විවිධ තනතුරු ඇති නිලධාරීන් ද හමුවේ.

## නිගමනය

අනුරාධපුර යුගයේ මෙරට පැවති සංකීර්ණ වාරිමාර්ග පද්ධතිය පිලිබඳව සලකා බැලීමේ දී ඒවා ඉදිකිරීම සඳහා විශේෂඥ තාක්ෂණික දැනුමක් තිබූ ශිල්පීන් පිරිසක් ද ඒවා නිසියාකාර ව පවත්වා ගෙන යමින් ජල කළමනාකරණය සිදු කිරීම සඳහා නිලධාරීන් පිරිසක් සිටි බවට හඳුනාගත හැකි ය. වැව් භාවිතා කිරීමේදී වැව්සුරක්ෂිතභාවය හා පැවැත්ම උදෙසා නීති රීති ක්‍රමවේදයන් යම් යම් රාජ්‍ය සමයන් තුළ පැවැති බවට තොරතුරු දැකගත හැකි ය. වැව් නිරන්තරයෙන් ප්‍රතිසංස්කරණය කර ඇති අතර ජලය ගබඩා කිරීම, මුදාහැරීම හා කෘෂි භෝගවලට ලබාදීමමනාව සිදු කොට ඇති බවට අනාවරණය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමිල, ඉන්දික. එම්. කේ. (2012)*අනුරාධපුර යුගයේ සමාජ ක්‍රමය*.කොළඹ: ඇස් ගොඩගේ සහ සහොදරයෝ.

විතානාච්චි. සී. ආර්. (2012) පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, *ශ්‍රී ලාංකේය ඉතිහාසය*.කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විතානාච්චි. සී. ආර්.(2017)*පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය*.කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.